## 2018 ජූනිමස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2018 ජූනි මස මාසික සභා රැස්වීම 2018.06.07 වන දින පෙ.ව.10.30 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.පී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත කුසුම් කුමාර මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්.සුමනාවතීමැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්, පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම

2018.05.03 වන දින පැවති මාසික සභා වාර්තාවේ 5.6 සම්බන්ධයෙන් අදහස් දැක් වූ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ඔහුගේ යොජනා අංක 1 හි වැලිගෙපොල වීරසේකර මුදලින්දාරාම විහාරස්ථානයේ වාර්ෂික පොසොන් පෙරහැර සඳහා සහා අරමුදලින් රු 50000/=ක මුදලක් ලබා දීමට කරන ලද යෝජනාවේ රු.25000/= ක් පරිත්‍යාග කිරීම සුදුසු බව වාර්තා වී ඇතත් එය රු.50000/= ලෙස සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

එම වාර්තාවේ යෝජනා අංක 5.4 (iii) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එල්.ගුණතිලක මැතිතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී, නිවාස සංවර්ධන අධිකාරිය සතුව පවතින සඳගනාගම ක්‍රීඩා පිටිය සභාවට පවරා ගැනීම සම්බන්ධයෙන් තමා විරුද්ධ වන බව එදින රැස්වීමේ දී ප්‍රකාශ කලද වාර්තාවේ එය සටහන් වී නොමැති බවගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය විසින් සඳහන් කිරීමෙන් අනතුරුව පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කිරීමෙන් පසුව සභා සම්මත විය.

## 2. <u>ගරු සභාපති තුමාගේ නිවේදන</u>

I. 2018 වර්ෂය සඳහා කිරුම් හා මිනුම් උපකරණ මුද්‍රා තැබීමේ කටයුතු 2018.ජුනි මස 14,18,19 හා 20 යන දිනයන් හි කාර්යාල පරිශ්‍රෙය්දී සිදු කිරීමට නියමිත බව,ගරු සභාපතිතුමා විසින් සභාවේ දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කල අතර,වැලිගෙපොල විහාරස්ථානය හෝ අම්බැවිල විහාරස්ථානය මුල් කර ගෙන තවත් අවස්ථාවක් ලබා දීමට කටයුතු කර ඇති බව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය දැනුම්දුන් බවද,ගරු සභාපතිතුමා විසින් සභාවේ දැනගැනීම සඳහා සඳහන් කළේය.ඉහත කාරණය සම්බන්ධයෙන් ව්‍යාපාරික හිමියන්ගේ දැන ගැනීම සඳහා අදාල දැන්වීම ප්‍රසිද්ධ කරවීමට කටයුතු කල යුතු බවට මෙම අවස්ථාවේදී සභාවේ අදහස් පළ විය.

II. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මඟින් පැවැත්වීමට නියමිතව ඇති

- පරිගණක සහතික පත්‍ර පාඨමාලාව සහ
- ෆොටෝ ෂොප් සහතික පත්‍ර පාඨමාලාව සඳහා සහභාගී වීමට ගරු මන්ත්‍රීතුමන්ලාට,මන්ත්‍රීතුමියන්ලාට සහභාගී විය හැකි බව ගරු සභාපති තුමා සභාවට දැනුම් දෙන ලද අතර ඒ සඳහා කැමැත්තක් දක්වන අයට අයදුම් කරන ලෙස ඉල්ලා සිටියේය.

III. මෙම සභාව මඟින් පාලනය වන සියළුම ජල ව්‍යාපෘති වල 2017 වර්ෂයට අදාලව රු. 497,944/= හා 2018 වර්ෂයට අදාලව රු. 355,440/= මේ වන විටත් ලේඛන ගතව නොගෙවී ඇති බැවින්,එසේ දිගින් දිගටම ගෙවීම් පැහැර හරින්නන්ගේ ජල සැපයුම් විසංධි කිරීමට කටයුතු කරන බව සභාවේ දැන ගැනීමට සලස්වන ලදී.

IV. අලුතින් තක්සේරු කරන ලද ප්‍රෙද්ශ වල වරිපනම් බදු කපා හැරීම සම්බන්ධයෙන් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ, මෙම කාලසීමාව තුල නම් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගතයුතු බවත්,ඒ ගැන සාකච්ඡා කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බවත්,ගරු සභාපතිතුමා විසින් සභාවේ දැන ගැනීම සඳහා ප්‍රකාශ කර සිටින ලදී.

## 3. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

පසුගිය සභා රැස්වීමට අදාලව වෙනත් කරුණු යටතේ ප්‍රකාශ වූ කරුණු සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර ඇති බවත්,ඒ අනුව පහත සඳහන් පිළිතුරු ලිපි ලැබී ඇති බවත්,සඳහන් කල ගරු සභාපතිතුමා පසුගිය සභා රැස්වීමේදී වැඩි දෙනෙකු විසින් යෝජනා කර ස්ථිර කරගත් පරිදි වීථි පහන් යාවත්කාලීන කිරීමේ කටයුතු සහ ග්‍රාමීය මාර්ග එළිපෙහෙළි කිරීමේ කටයුතු මේ දින වල සිදු කෙරෙමින් පවතින බව ප්‍රකාශ කළේය.

## 4. සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

4.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය අසනීප වීමේ හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින් ඔවුන් දෙදෙනාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

4.2. නාය යාමෙන් අවතැන් වුවන් නැවත පදිංචි කිරීම සඳහා අත්පත් කරගත් ඉඩම සඳහා පානීය ජල පහසුකම් ලබා ගැනීම

ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාය යාමේ තර්ජනයට ලක්ව ඇති ඉඩම් වල පදිංචි ජනතාව ඉන් ඉවත්කර හුණුවල වතුයායේ ඉඹුල්තැන්න ප්‍රෙද්ශයෙන් අක්කර 13 ක ඉඩම් කොටසක් රජයට අත්පත් කරගෙන ඇති බවත්, එම කොටසේ නිවාස 75 ක ප්‍රමාණයක් ඉදි කර නායයාමේ තර්ජනයට ලක්ව ඇති ජනතාව නැවත පදිංචි කරවීමට සැලසුම් කර ඇති බවත්,සඳහන් කරමින් ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් බළුවන ලද අංක OPDS/LND/04/NHU/ACQ/08/03 හා 2018.05.17 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

එකී ලිපියෙන් මෙම සභාවට අයත් ජල සම්පාදන ව්‍යාපෘතියක් මගින් අවශ්‍ය ජල පහසුකම් සපයා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

4.3. නාය යාමෙන් අවතැන්වූවන් නැවත පදිංචි කිරීම සඳහා රජයට අත්පත් කරගත් ඉඩමේ පවතින ජලනල පද්ධතිය සම්බන්ධව.

ඉහත කාරණය සම්බන්ධයෙන් ඕපනායක ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කරන ලද ඔහුගේ අංක OPDS/LND/04/NHU/ACQ/08/03 හා 2018.05.17 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

එකී ලිපිය මගින් ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාය යාමේ තර්ජනයට ලක්ව ඇති ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන භූමිය තුල සභාව සතු ජල ව්‍යාපෘතියේ ජල නල පද්ධතිය ව්‍යාප්තව ඇති බැවින් ,එහි පදිංචි කරනු ලබන ජනතාවගේ ඉඩම් හා ප්‍රෙවිශ මාර්ග වලට ගැටළුවක් නොවන පරිදි ජල නල පද්ධතිය සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා ඇත.

4.4. මිදෙල්ලදෙනිබෝක්කුවක් සම්බන්ධවයි

නො.52 ,මිදෙල්ලදෙනිය,ඕපනායක ලිපිනයෙහි පදිංචි එම්.කේ.සීලවතී මහත්මිය විසින් යොමු කරන ලද 2018.05.30 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

එකී ලිපිය මඟින් බොහෝදෙනාගේ ගමන් පහසුව සඳහා ඇයගේ නිවස අසල මාර්ගයට පෝක්කුවක් දමා සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

4.5. සුහද අවමංගල්‍යාධාර සමිතියට හට් එකක් ලබා ගැනීම

ඉළුක්කුඹුර ග්‍රාම නිලධාරී වසමට අයත් සුහද අවමංගල්‍යාධාර සමිතියට අත්‍යාවශ්‍යව ඇති ටකරන් මඩුවක් ලබා දෙන ලෙස එම සමිතිය විසින් 2018.05.15 දිනැතිව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා වෙත ඉදිරිපත් කර ඇති ලිපිය එතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

4.6. අඟුලියද්ද බෝපිටිගොඩ ප්‍රධාන මාර්ගය පිළිසකර කර ගැනීම සම්බන්ධවයි.

අඟුලියද්ද බෝපිටිගොඩ මාර්ගයේ දොළ හරහා වැටී ඇති පාලම ඉතා අබලන්ව ගමනාගමන අපහසුතා මතුව ඇති බැවින්,එම ස්ථානයට පැති බැම්මක් යොදා පාලම සකස්කර ගැනීමට අවශ්‍යය ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලා ආර්.එම්.අචිනි රත්නායක මහත්මිය විසින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එ්.ගුණතිලක මැතිතුමා මඟින් එවා ඇති ලිපිය සභා ගත කරන ලදී.

4.7. කාණුවක් සඳහා බෝක්කු කඳන් ලබා ගැනීම

පිටවෙල රංවල ගොඩකවෙල පදිංචි ජී.කේ.කරුණාරත්න මහතා විසින් රංවල රෝහල අසලින් ඇති මාර්ගය පිළිසකර කර ගැනීම සඳහා හියුම් පයිප්ප 2ක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා මඟින් කරන ලද ඉල්ලීම එතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

4.8. ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම සඳහා

ඉහත මැයෙන් යුතුව රංවල,ගොඩකවෙල ඩී. පාලිත රවීන්ද්‍ර වික්‍රමසිංහ මහතා විසින් ගරු සභාපතිතුමා මඟින් එවන ලද 2018.04.20 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

එකී ලිපිය මඟින් රංවල,එළමල්පෙ බෝධිමළු විහාර මාර්ගය දූෂුකර මඩ වගුරු සහිත මාර්ගයක් බැවින් එම මාර්ගයේ මීටර් 350 ක් දුරට කොන්ක්‍රීට් කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

## 5. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ

යතා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 6. කල් දී ඇති යෝජනා

### 6.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. සභාකාර්යාල පරිශ්‍රයතුලCCTV කැමරාපද්ධතියක් සවි කිරීම සුදුසු බවත්,ඒ සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කළේය.

II. සභාව සතු වාහන එළිමහනේ ගාල් කිරීම නිසා ඒවා ඉතා ඉක්මනින් දිරාපත් විය හැකි බැවින්,සභා කාර්යාල පරිශ්‍රය තුල රථ ගාලක් ස්ථාපනය කිරීම සුදුසු බව යෝජනා කළේය.

III. ප්‍රාදේශිය සභාවේ දිවා කාලය තුල මුර සේවය සඳහා අයෙකු සේවයේ යොදවා නොමැති බවත්,ඒ සඳහා තනතුරක්ද නොමැති බැවින් දිවා මුර සේවය සඳහා තනතුරක් ඇති කිරීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ඉල්ලා සිටියේය.

IV. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ප්‍රාදේශීය සභා පුස්තකාලයට අවශ්‍ය භෞතික සම්පත් ලබා දී පුස්තකාලයේ සේවා කටයුතු පුළුල් කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීමට අපේක්ෂාවෙන් පසුවන බව පැවසූ ගරු සභාපතිතුමා දැනට තිබෙන පුස්තකාලයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් පුස්තකාලය හා ඥානසල මධ්‍යස්ථානය යා කර ඉඩ සළසා ගැනීමට අනුමැතිය ඉල්ලා සිටියේය.

V. කාර්යාලයේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය ඇලුතින් වයරින් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

VI. කාර්යාලයේ වරිපනම් විෂය සඳහා පරිගණකයක් හා අවශ්‍ය මෘදුකාංග මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සුදුසු බව යෝජනා කළේය.

VII. කාර්යාල අභ්‍යන්තරයේ ශබ්ද විකාශන පද්ධතියක් සකස් කිරීම සුදුසු බව යෝජනා කළේය.

VIII. කාර්යාලයීය ජල අංශය සඳහා නව බිල් ක්‍රමයක් හඳුන්වා දීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

IX. අඹගහවින්න ජල ව්‍යාපෘතිය හොරන්කඳුර දක්වා දීර්ඝ කිරීම සුදුසු බවත්,කාණු කැපීම සහ වෙනත් කටයුතු සඳහා සභා කම්කරුවන් ප්‍රමාණවත් නොවන බැවින් කුලී පදනම මත සේවකයින් දෙදෙනෙකු ලබා ගැනීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරන ලදී .

X. සෞඛ්‍ය කම්කරු,රියදුරු හා ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ගම් බූට් සහ වැහි කබා ලබා ගැනීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කළේය.

XI. “මෙම ස්ථානයේ කසළ බැහැර කිරීම තහනම්”, “පොදු වැසිකිළිය” යන මැයෙන් නාම පුවරු කිහිපයක් සාදවා ගැනිම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

XII. සභාව මඟින් පාලනය වන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට අවශ්‍ය රුපියල් 100,000/= ක ඖෂධ, ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබා ගැනීමටත් යෝජනා කරන ලදී.

XIII. කාර්යාලයීය ජල ගබඩා කාමරයට ආවරණයක් සකස් කිරීමට යෝජනා කරන ලදී.

XIV. කොක්වලයාය ප්‍රදේශයේ සභාවට අයත් ප්‍රජා ශාලාවේ හවස්වරුවේ පෞද්ගලික පංතියක් පැවැත්වීමට ප්‍රදේශයේ දෙමාපියන් විසින් 2018.03.06 දිනැති ලිපියෙන් අවසර ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම අනුව එයට සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරන ලදී.

XV. සභාපතිතුමාගේ, ප්‍රධාන කළමනාකරණ සහකාරතුමාගේ සහ කාර්යාලීය අවශ්‍යතාව සඳහා ලාච්චු සහිත කබඩ් තුනක් මිලදී ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

XVI. කාර්යාලීය ගේට්ටුව දිරාපත්ව ඇති බැවින් තීන්ත ආලේප කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

XVII. වැඩසටහන් අයවැය ලේඛනය 2019 පිළියෙල කිරීමේ කාලසටහන සඳහා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරන ලදී.

XVIII. ආසියානු සංවර්ධන බැංකුව,දේශීය ණය සහ සංවර්ධන අරමුදල හා සභා දායකත්වය ඇතිව ස්ථාපනය කරන ලද උතුරු හුණුවල - පැළැන්දකන්ද ජල ව්‍යාපෘතිය වෙනුවෙන් දේශිය ණය හා සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය හා පොළිය වෙනුවෙන් එක් කාර්තුවකට රු 554,407.52/=ක මුදලක් ක්‍රමක්ෂය ලේඛනයේ සඳහන් ආකාරයට දේශීය ණය හා සංවර්ධන අරමුදලට සභා අරමුදලින් බැර කිරීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරන ලදී.

XIX. ඕපනායක ළදරු පාසලේ වයරින් එක කිරීම සහ ඊට විදුලිය ලබා ගැනීම අවශ්‍ය බව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී

XX. ගල්හිර මාර්ගයේ කඳු සහිත ස්ථාන කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන්රු.859,079.35/= ගෙවීම් කිරීම.

ඉහත සියළු යෝජනා ගරු උප සභාපතිඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමාවිසින් ස්ථිර කරන ලද අතර,සභාවට CCTV කැමරා පද්ධතියක් සවිකිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡාවට භාජනය වූ අතර ඒ ප්ලිබඳව ගරු සභාපතිතුමා අදහස් පල කරමින්,කාර්යාලයට ස්ථිර මුරකරුවෙකු නොමැති බැවින්,නූතන තාක්ෂණික ක්‍රමවේදයක් වශයෙන් CCTV කැමරා පද්ධතියක් සවි කිරීම කාලෝචිත බව සඳහන් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඒකමතික අනුමැතිය පල විය.

එම යෝජනාවන්ට අමතරව ගරු සභාපතිතුමා විසින් හදිසි යෝජනා ලෙස පහත යෝජනා සභා ගත කරන ලදී.

XXI. ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුත්තෙට්ටුපොල හා පල්ලෙබැද්ද යන ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි ජල සම්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර ,එම ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය මාර්ග වල ජල නල එලීම සඳහා අවසර ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදි.

XXII. මල්මීකන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මල්මීකන්ද සිට දූනුකාරගොඩ ගම දක්වා දිවෙන මාර්ගයට අයත් ඉඩම් ප්‍රමාණය මැනුම් කටයුතු කිරීමට අදාල මැනුම් ඉල්ලීම මිනින්දෝරු දෙපාර්ථමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ඕපනායක ප්‍රාදේශිය ලේකම් විසින් සභා අනුමැතිය ඉල්ලා ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදී.

XXIII. පනාවැන්න වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු සංනිවේදන තාක්ෂණ පාඨමාලාව හදාරා අවසානයේ මෙම සභාවේ මාස 06ක ආයතනික පුහුණුව ලබා ගැනිම සඳහා එච්.එෆ්.වයි.සඳමාලි ෆොන්සේකා යන අය විසින් ඉල්ලීමක් කර ඇති අතර ,ඒ සඳහා අවස්ථාව ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදී.

XXIV. සභාව සතු පහත නම් කරන ලද මාර්ග ,ක්‍රීඩා පිටි හා සුසාන භූමි සභාවේ JCB යන්ත්‍රය හා කම්කරුවන් යොදාගෙන එළිපෙහෙළි කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

මාර්ග

- ඕපනායකමිදැල්ලදෙනියමාර්ගය
- ඕපනායක විජයාරාම මාර්ගය (උඩතැන්න පාලම දක්වා)
- නව ගම්මාන මාර්ගය
- ඕපනායක බෝගහ අසල සිට මීගස්දෙනිය හන්දිය දක්වා මාර්ගය
- ඕපනායක බෝගහ අසල සිට ගල්හිර මාර්ගය
- ගල්හිර මාර්ගය (දූනුකාරගොඩ කෙළවර දක්වා)
- කන්දේවිහාර මාර්ගය (පල්ලේකන්ද පාසල දක්වා)

- මිදැල්ලදෙනිය හේන්යාය මාර්ගය
- මැටිහක්වල පාසල අසල සිට ගල්හින්න මාර්ගය
- උඩවෙල හොරන්කඳුර මාර්ගය
- අකරැල්ල හත්තැලිහෙල හත්තැල්ල මාර්ගය
- උඩවෙල මීගස්දෙනිය වල්ලකැටිය මාර්ගය
- දන්දෙනිය මහින්දාරාම මාර්ගය
- හත්තැල්ල තැන්නයාය මාර්ගය
- උඩවෙල රෝහල මාර්ගය
- මාදොල අඹගහවින්න මාර්ගය
- මාදොල පන්සල අසල සිට වෙළන්ගහකුඹුර මාර්ගය
- උඩගම හපුගස්තැන්න මාර්ගය (වැලිගෙපොල දක්වා)
- වළගම්බා විද්‍යාල මාවත
- කොට්ටිඹුල්ලවල හැවැන්දෙනිය මාර්ගය (ඌරාවල පාසල අසල)
- අම්බැවිල මුත්තෙට්ටුවපොල මාර්ගය
- තලගස්කන්ද මහෝමාර මාර්ගය
- රංවල දෙල්වලකන්ද මාර්ගය
- රංවල පිටකන්ද දෙල්වල මාර්ගය
- ගල්පාය පුස්සතොට මාර්ගය
- හල්ලින්න උඩගමසිට රංවල මාර්ගය (2 km)
- වතුකන්ද මාර්ගය
- පහලවෙල මාර්ගය
- වැලිගෙපොල රජ මාවත
- පහලවෙල මාර්ගය
- පොල්බොක්ක සිට හල්ලින්න ප්‍රදේශයට පිවිසෙන මාර්ගයේ ඉතිරි කොටස පස් ගොඩ කර සකස් කිරිම.

සුසාන භූමි

- මාදොල  සුසාන භූමිය
- ඕපනායක සුසාන භූමිය
- දන්දෙනිය සුසාන භූමිය
- සඳගනාපුර සුසාන භූමිය
- තලගස්කන්ද සුසාන භූමිය

ක්‍රිඩා පිටි

- මාදොල  ක්‍රීඩා පිටිය
- තලගස්කන්ද  ක්‍රීඩා පිටිය

XXV. පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා ඔවුන්ගේ ධූර කාලයට පමණක් සීමාවන සේ මසකට රු.12000/= ක දීමනාවක් මත පෞද්ගලික ලේකම්වරයෙකු පත්කර ගැනීමට පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4/2014 හා 2014.11.28 දිනැති චක්‍රෙල්ඛය හා සංශෝධිත CLG/21/30 හා 2009.11.23 මඟින් අනුමැතිය ලබා දී ඇති බැවින් ඒ අනුව 2018.07.02 දින සිට පෞද්ගලික ලේකම්වරයෙකු ලෙස කටයුතු කිරීමට ඩබ්ලිව්.යූ.ඩිල්ෂ මලිත් මහතා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමටත් ඒ වෙනුවෙන් ඔහුට රු.12000/= ක දීමනාවක් ගෙවීමටත් සහා අනුමැතිය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

XXVI. පළාත් පාලන ආයතන වල මහජන නියෝජිතයින් සඳහා ඉන්ධන දීමනාව සහ දුරකථන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 3/2012 හා 2012.05.29 දිනැති චක්‍රලේඛය හා අංක 3/2014 හා 2014.10.30 දිනැති චක්‍රලේඛ මඟින් අනුමැතිය ලබා දී ඇති බැවින් ,සභාවේ මූල්‍ය ශක්තිය අනුව ඉන්ධන දීමනාව හා දුරකථන දීමනාව ප්‍රතිපූර්ණය කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව අනුව ,2018.අප්‍රේල් මස සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුල සියළුම සභිකවරුන් සඳහා රු 3000/= ක උපරිමයකට යටත්ව ඉන්ධන දීමනාවක් සහ දුරකථන දීමනාව සභාපතිතුමාට රු. 2500/= ක් ලෙසද උප සභාපතිතුමාට රු.2000/=ක් ලෙසද අනෙකුත් සියළුම සභිකවරුන් සඳහා රු.1500/=ක් ද ප්‍රතිපූරණය කිරීම ඇතුළු ගරු සභාපතිතුමාගේ සියළු යෝජනා සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලැබිණ.

## 6.2. ගරු උප සභාපති ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා

I. ගල්පාය විද්‍යාලයේ නර්ථන කණ්ඩායම සමස්ථ ලංකා තරග සඳහා තේරී පත්වී ඇති අතර ඊට සහභාගී වීම සඳහා විශාල මුදලක් වැය වන බැවින්,ඒ සඳහා සභා අරමුදලින් රු.20000/= ක් ලබා දෙන ලෙස යෝජනා කළේය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා වැඩි දුරටත් අදහස් පල කරමින්,ගල්පාය වැනි දුෂ්කර ප්‍රදේශයක දරුවන් සමස්ථ ලංකා තරගයකට තේරීපත් වීම භාග්‍යයක් බවත් සඳහන් කරමින් සමස්ථ ලංකා තරගයට ඉදිරිපත් වීම සඳහා විශාල මුදලක් වැයකිරීමට සිදු ව ඇති අතර,එම මුදල සපයා ගැනීමට එම විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය මෙන්ම දෙමාපියන් මූල්‍ය දුෂ්කරතාවයට ලක්ව ඇති නිසා සභා අරමුදලින් මෙම මූල්‍යාධාරය ලබා දෙන ලෙස ඉල්ලා සිටීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමා විසින් කරන ලද යෝජනාවට සභාවේ ඒකමතික අනුමැතිය ලැබිණ.

අනතුරුව එම යෝජනාවට සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීමට තීරණය විය.

## 6.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය

ගරු මන්ත්‍රීතුමිය විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. දන්දෙනිය තෝරවත්ත පන්සල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම.
II. දන්දෙනිය පාරේ ගමන් ගන්නා කුණු ට්‍රැක්ටරය කිරඹ පන්සල දක්වා දීර්ඝ කිරීම.
III. ඕපනායක ක්‍රීඩා පිටිය පිටුපස කාණු පද්ධතිය පිළිසකර කිරීම
IV. ඕපනායක සති පොළ පිළිසකර කිරීම
V. හත්තැල්ල මංසන්දියේ සිට හත්තැල්ල පාසල දක්වා දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම
VI. මිදෙල්ලදෙනිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම.
VII. වීථි පහන් පිළිසකර කිරීම.

ඉහත ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරන ලද යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත්කරන යෝජනා අතරින් දන්දෙනිය පන්සල පාර අවහිර වූ ස්ථානය සකස්කර ඇති බවත්,වීථි පහන් නඩත්තු කටයුතු දැනටමත් අරම්භකර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් පවසන ලද අතර ප්‍රදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ඕපනායක සති පොළ සංවර්ධනය කිරීමේ යෝජනාව ඇතුලත් කර ඇති බවද ප්‍රකාශ කිරීමෙන් අනතුරුව එතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා සභාවේ අනුමැතිය ලැබිණ.

## 6.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

ගරු මන්ත්‍රීතුමිය අසනීප තත්වයක් හේතුවෙන් සභා රැස්වීමට නොපැමිණිය අතර,එතුමිය විසින් න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති පහත සඳහන් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමාසභාවට ඉදිරිපත් කරන ලදී.

I. හටන්ගල සිට විකිරවිට හරහා කොට්ටිඹුල්වල දක්වා දිවෙන මාර්ගය කි.මී.11/2 ක් ප්‍රමාණය කොන්ක්‍රීට් කිරීම.

එම යෝජනාව ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව සභා සම්මත විය.

## 6.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. තලගස්කන්ද මැදගංඔය පාර පොදු ළිඳ ලඟින් වමට ඇති දෙවන පටුමග කොන්ක්‍රීට් කිරීම.
II. තලගස්කන්ද මැදගංඔය පාර පොදු ළිඳ ලඟින් දකුණට ඇති ලයනල් මහතාගේ නිවස දෙසට දෙවන පටුමග කොන්ක්‍රීට් කිරීම.
III. මැදගංඔය ගලපාත පුරාණ රජමහ විහාරයට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම
IV. මැදගංඔය කන්දෙකැල්ල වේල්ල පහල කොටස වේල්ල සැකසීම
V. ඉඹුල්තැන්න ක්‍රීඩාංගනය අසල සුසාන භූමිය පවරා ගෙන ආදාහනාගාරයක් ඉදිකිරීම.
VI. නරිස්ස ප්‍රදේශයට සුසාන භූමියක් සඳහා ඉඩමක් වෙන් කරවා ගැනීම.
VII. බස්නකන්ද ප්‍රදේශයට සුසාන භූමියක් සඳහා ඉඩමක් වෙන් කරවා ගැනීම.
VIII. නරිස්ස බස්නකන්ද මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම.
IX. ගල්කන්ද ගොංජල මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම.
X. ඕපනායක උඩුකුඹුර පාර දන්දෙනිය දක්වා මාර්ගය දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම සහ දෙපස කැලෑව ඉවත් කිරීම බොගහයට කොටසද ඇතුළුව.
XI. ඕපනායක බෝගහ හංදියේ සිට වල්ලකැටිය දක්වා මාර්ගය ඉතිරි කොටස් කොන්ක්‍රීට් කිරීම.
XII. බටේවෙල වීරසිංහ මහතාගේ නිවස අසල සිට බටදූර විදුහල සක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම.
XIII. පහල හේන්යාය ප්‍රදේශයට සුසාන භූමියක් සඳහා ඉඩමක් වෙන් කර ගැනීම.
XIV. පරගහමඩිත්ත එපිටවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම.
XV. පරගහමඩිත්ත පින්නගල අකරුල්ල මාර්ගය දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම.
XVI. බටේවෙල නින්දකුඹුර මාර්ගයේ ගුණතිලක මහතාගේ නිවෙස්වලට යන මාර්ගය හරහා යන වේලි සඳහා අවශ්‍ය සිලින්ඩර ලබා දීම.
XVII. බටදූර හොරකැලේ ධර්මදාස මහතාගේ නිවෙස අසලින් විටිවෙල මාර්ගය කොන්ක්‍රීට් කිරීම එන්.ජී.ප්‍රියන්ත මහතාගේ නිවසට යන මාර්ගය.
XVIII. ගල්කන්ද බස්නකන්ද මාර්ගය කාණු දමා සකස්කර ගැනීම සඳහා JCB යන්ත්‍රය ලබා ගැනීම.
XIX. ධම්මික මහතාගේ නිවස ලග සිට බටකැලේ දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම.
XX. කිරඹ කන්දඋඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එතුමා විසින් යෝජනා කරන ලද ගල්කන්ද ,බස්නකන්ද මාර්ගයේ ගමන් අපහසුතා රැසක් මතුව ඇති බැවින් JCB යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීමෙන් ගමන් අපහසුතාවය මගහරවා ගත හැකි බවට මෙහිදී ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් අදහස් පලකිරීමෙන් අනතුරුව,උඩවෙල අකරැල්ල මාර්ගය සහා කම්කරුවන් හා JCB යන්ත්‍රය යොදවා පිළිසකර කිරීමෙන් පසුව මෙම මාර්ග සංවර්ධනය කිරීමට තීරණය කරන ලදී.මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් පොල්බොක්ක අළුත්සහල් පොලට යන මාර්ගයට යාබදව විශාල වලක් හාරා ඇති බවත්,ඒ හේතුවෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

## 6.6.ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

I. අසමානකන්ද එගොඩ කොටස මාර්ගය කැපීම සුදුසු බවත්,

II. අම්බලන් මුල්ලේ සිට නාවින්න ප්‍රදේශයට පිවිසෙන මාර්ගයේ දොල පාරට පාලමක් ඉදිකිරීම සුදුසු බවත්,

III. හල්ලින්න රබර් ලැයිම මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කල යුතු බවත්, ඉහත ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත්කරන ලද යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව සභා සම්මත විය.

## 6.7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. බටදුරවසමේබටේවෙලදොලහරහාකොන්ක්රීට්ලැල්ලක්සවිකරදීම.

II. ගල්කන්ද සූසාන භූමිය මැන වෙන් කිරීම.

III. හත්තැලිහෙල එල්.ඩබ්ලිව්.සුමනරත්න මහතාගේ නිවස අසල පොදු ළිඳ අළුත්වැඩියා කිරීම.

IV. බටදුර හංදිය සහ බටදුර විද්‍යාලය අසල වීථි පහන් සවි කිරීම.

ඉහත ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගල්කන්ද සූසාන භූමිය අනවසර අල්ලා ගැනීම්වලට ලක්ව ඇති බැවින් ,එය නිරවුල් කිරීම ඉතා ඉක්මණින් කල යුතු බව ට අදහස් දැක්වූ අතර,හත්තැල්ල පොදු ළිඳ අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ද ඉල්ලීමක් කිරීමෙන් පසුව ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කල යෝජනා සඳහා සභාවේ ඒකමතික අනුමැතිය පල විය.

## 6.8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

I. රංවලරෝහලඉදිරිපිටමාර්ගයේසංවර්ධනකටයුතුසඳහාදිගඅඩි 6*2

ප්රමාණයේහියුම්පයිප්පදෙකක්ලබාගැනීම හා ,

II. අම්මඩුව,වෙලගපොල,පුරන්වත්තප්‍රදේශසඳහාවීථිලාම්පුසවිකිරීම අවශ්‍ය බවත්,

ගරු මන්ත්‍රීතුමා සභාවට යෝජනා කරන ලද අතර ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව් සුමනාවතී මැතිතුමිය විසින්ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

ගරු බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් හදිසි යෝජනාවක් ලෙස පහත යෝජනාව ඉදිරිපත් කරන ලදී.

III. උඩවෙල උඩරංවල ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකල මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම.

මෙහි දී වැඩිදුරටත් අදහස් දැක් වූ ගරු මන්ත්‍රීතුමා එම මාර්ගයේ මීටර් 100ක පමණ දුරක් දැඩි සේ අබලන් වී ඇති බව සඳහන් කල අතර සභාවේ JCB යන්ත්‍රය හා කම්කරුවන් ලබා දෙන්නේ නම් ගම් වැසියන්ගේ ශ්‍රම දායකත්වය ලබාගෙන එම කොටස සංවර්ධනය කරගත හැකි බව ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

## 6.9.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව් සුමනාවතී මැතිතුමිය

ගරු මන්ත්‍රීතුමිය විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ඊරියගස්මුල්ල, හොරන්කඳුරප්‍රදේශවාසීන්කීපදෙනෙකුවිසින්පානියජලයලබාගැනීමසඳහාසභාවටමුදල්ගෙවාඇතිඅත රඹවුන්සඳහාජලයලබාදීම.
II. කරගහයට - තැන්නහේන මාර්ගයේ මීගහවෙල වසමට අයත් ගොඩටික ගම අසළ වෙල් යාය දෙපස ඇති පැති බැම්ම පිළිසකර කිරීම.
III. පැළැන්දකන්ද විද්‍යාලයට යන මාර්ගයේ ඇති කුඩා ඇල නිසා වර්ෂා කාලයේ ගමන් කිරීම අපහසු බැවින් එම ස්ථානයේ උස අඩි 8ක් හා දිග අඩි 20 පැති බැම්මක් බැඳ එයට අඩි 06 ක් දිග 11/2 පළලින් යුත් හියුම් පයිප්ප දෙකක් සවි කිරීම
IV. තැන්නහේන සුසාන භූමියට යන මාර්ගයේ නෙලු මණ්ඩිය ගම අසල වතුර බැස යන ස්ථානයේ බෝක්කුවක් යෙදීම.

ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත්කල යෝජනා ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

## 7. කාරක සභා වාර්තා සලකා බැලීම.

### 1.1. 2018.05.18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව කරනු ලැබූ තීරණ අංක 38 -අංක 50 දක්වා වූ වියදම් සහ එදින කාරක සභාවට යොමු කරන ලද අංක 51 -69 දක්වා වූ වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 8. ආදායම් වියදම් වාර්තා

## 8.1. <u>2018.අප්‍රේල් මස ආදායම් වියදම් වාර්තාව</u>

| ලැබීම් සාරාංශය (රුපියල්) | | වැය සාරාංශය (රුපියල්) | |
|---|---|---|---|
| වරිපනම් බදු | 536,777.69 | වැටුප් හා දීමනා | 2,444,082.70 |
| කුලී | 81,953.03 | ගමන් වියදම් | 7,000.00 |
| බලපත්‍ර ගාස්තු | 379,500.00 | සැපයුම් හා උපකරණ | 291,292.44 |
| සේවා සඳහා ගාස්තු | 81,438.00 | ප්‍රාග්ධන වත්කම් අළු.හා නඩත්තුව | 52,362.00 |
| වරෙන්තු ගාස්තු | 3,545.17 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 164,315.23 |
| වෙනත් ආදායම් | 16,123.16 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 2,013,519.04 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 3,112,856.09 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 18,264.85 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 2,977,317.22 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | - |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 3,112,856.09 | ණය ආපසු ගෙවීම් | 242,895.00 |
| සේවක ණය | 82,437.78 | සේවක ණය | - |
| තැම්පත් | 89,643.98 | තැන්පත් | 25,000.00 |
| අත්තිකාරම් | 108,219.78 | ණයහිමි | 1,034,146.81 |
| ණය ගැති(කර්මාන්ත) | 371,359.23 | අත්තිකාරම් | - |
| වෙනත් ලැබීම් එකතුව | 651,660.77 | ජල ගබඩා | - |

## 8.2. 2018 අප්‍රේල් 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

*2018 .06.07 මාසික සභා රැස්වීම*



| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.04.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | අයකිරිමට ඇති ඉතිරිය |
|---|---|---|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| - | - | ගබඩා(ඖෂධ) | - |
| - | - | වෙනත් ගෙවීම් එකතුව | 1,059,146.81 |
| මුළු එකතුව | 3,764,516.86 | මුළු ගෙවීම් | 4,279,359.03 |

| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **188521** | **4%** | **596962** | **31%** | **1343038** | 4514760 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8106** | **11%** | **5741** | **27%** | **15159** | 63036 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි නිරීම1.43 | | 125000 | | | **111175** | **89%** | **13825** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 255000 | - | | **193200** | **76%** | **61800** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **671500** | **92%** | **58500** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **4500** | **15%** | **25500** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **48737** | **11%** | **409263** | |
| 8 | ජල ගාස්තු 4.14 | 1868941 | 6075000 | 1102483 | **59%** | **911287** | **15%** | **5163713** | 766458 |
| 9 | විකුණුම් | | 497000 | | | **53575** | | | |
| 10 | යන්ත්‍ර කුළියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **81950** | **8%** | **968050** | |
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 250000 | | | **12423** | **5%** | **237577** | |
| 13 | පොදු වෙළඳපල කුළී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුළී 5.23(2) | 178393 | 428000 | 108861 | **61%** | **51800** | **12%** | **376200** | 69532 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | **24412** | **22%** | **85588** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 25880 | 254000 | 5000 | **19%** | **84350** | **33%** | **169650** | 20,880 |
| 18 | නිවාස කුලී | | | | | | | | |
| 19 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | **303000** | **76%** | **97000** | |
| 20 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | **58100** | **19%** | **241900** | |
| 21 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | **0** | **0%** | **2,000** | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **22** | වෘත්තීය බලපත්‍ර 1.33 | | **100** | | | **-** | **0%** | **100** | |
| **23** | පොලී ආයෝජන 1.61 | | **500** | | | | **0%** | **500** | |
| **24** | සේවක ණය පොලී1.64 | | **40000** | | | **15150** | **38%** | **24850** | |
| **25** | අයකර ගතහැකි ගාස්තු2.43 | | **25000** | | | **1750** | **7%** | **23250** | |
| **26** | සභාව සතු ගොඩනැගිලි3.25.1 | | **1000** | | | **1,500.00** | **150%** | **(500)** | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | **2017.12.31 ට හිඟ** | **2018 වර්ෂයේ** ඇස්තමේන්තුගත ආදායම | **2018.04.31** දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරීමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| **27** | දඩ අනවසර ඉදිකිරීම් 3.52 | | **500** | | | **-** | **-** | **500** | |
| **28** | අය කර ගත හැකි ගාස්තු 4.43 | | **1000000** | | | **327000** | **33%** | **673000** | |
| **29** | විශේෂ සැපයුම් සඳහා ගාස්තු4.16 | | **5000** | | | **-** | **-** | **5000** | |
| **30** | පොළ භූමිය කුලියට දීම5.25 | | **1000** | | | **300.00** | **0.30** | **700** | |
| **31** | ක්‍රීඩා පිටි ටකරන් මඩු කුලියට දීම6.25 | | **2000** | | | **0** | **0%** | **2000** | |
| | **වෙනත් ආදායම්*** | **15279** | **878140** | **15279** | **100%** | **197478** | **22%** | **680662** | |
| | **මුළු එකතුව** | **6837036** | **15179140** | **1428251** | **21%** | **3755891** | **25%** | **10979824** | **5434666** |

**වෙනත් ආදායම්***

| අනු අංකය | ආදායම් ප්‍රභවය | **2017.12.31** ට හිඟ | **2018 වර්ෂයේ** ඇස්තමේන්තුගත ආදායම | **2018.04.31** දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | අයකිරීමට ඇති ඉතිරිය |
|---|---|---|---|---|---|---|

| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම | | | | | | | | |
| 3 | පා පැදි බලපත්‍ර 1.35 | | 150 | | | - | 0% | 150 | |
| 4 | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළි කුලියට දීම | | | | | | | | |
| 6 | කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13 | 5000 | 107000 | 5,000.00 | 1.00 | 13,000 | 12% | 94000 | - |
| 7 | සභා භූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල් පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 27000 | 14% | 173000 | |
| 10 | පුස්තකාල සේවා ගාස්තු 6.43 | | 15000 | | | 1160 | 8% | 13840 | |
| 11 | පුස්තකාල දඩ 6.52 | | 20000 | | | 1724 | 9% | 18,276 | |
| 12 | ඉඩම් විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 10279 | 448390 | 10279 | 100% | 128394 | 29% | 319996 | - |
| 14 | වෙළෙඳ ස්ථාන කුලී03.22 | | 87600 | | | 26200 | 30% | 61,400.0 | |
| | එකතුව | 15279 | 878140 | 15279 | 100% | 197478 | 22% | 680662 | - |

## 9. වෙනත් කරුණු

**9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා**

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා සහනදායි ක්‍රමයකට යතුරුපැදි ලබා දීමේ වැඩපිළිවෙලක් සකස් කරදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා**

රංවල,උඩරංවල මාර්ගය සංවර්ධනය කිරීමට ගරු සභාපතිතුමා විසින් තෝරා ගැනීම සම්බන්ධයෙන් සහ උත්සව අවස්ථාවකට ජල බවුසරය ලබා දීම සම්බන්ධයෙනුත් ස්තූතිය පළ කල ගරු මන්ත්‍රීතුමා සභාවේ ආදායම් තත්වය වැඩිකිරීම වෙනුවෙන් මන්ත්‍රීවරුන් වශයෙන් උපරිම සහය ලබා දිය හැකි බව ප්‍රකාශ කළේය.

**9.3. ගරු ප්රාදේශීය සභා මන්ත්රිනී එන්.වී.ශ්රීමාවතී මැතිතුමිය**

ප්‍රදේශයේ බහුලව පවතින හොර මත්පැන් ජාවාරම නිසා බොහෝ පවුල් වල ගැටුම් ඇතිවීමෙන් කාන්තාවන් හා දරුවන් දැඩි හින්සනයට ලක් වන බවත්,ඒ සම්බන්ධයෙන් ගත හැකි සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටියාය.

**සභා රැස්වීමේ නිමාව**

අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තූතිය පලකල ගරු සභාපතිතුමා සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කරමින් සභාවේ කටයුතු පස්වරු 1.00ට පමණ නිමාවට පත්කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,

සභාපති,

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.